
Lyrics by
Sisira Dissanayake

ඒතෙර මෙතෙර අපේ ළමා ගී

# ඇතුරු මිතුරු



සිසිර දිසානායක මාමාගේ ගී පද රචනා




## සුවඳ කැකුළු
( දෙරට වැඩුම )

සුවඳ කැකුළු මල් මිටක්
මෙන්න පිපෙනවා
පාටවලින් හැඩ වෙලා
ලොවට පිපෙනවා

සරසවියගෙ වරම් දිනා
මව්පියන් අතින්
සුරතලෙන් හැඩවෙලා
ලස්සනයි ළමුන්

අකුරු සතර දැන හඳුනා
ගුරුවරුන් අතින්
ශිල්පයෙන් ඔප වෙලා
සුවඳ දෙයි ළමුන්

මේ බලන්න - මේ අහන්න
අපේ හපන්කම්......!

තනුව : සිසිර දිසානායක
සංගීතය : විශාරද රෝහණ ධර්මකීර්ති
ගායනය : එච්. එම්. දීප්තිකා අශානි
පී. එල්. නදීෂා පියුමි
පී. එල්. නිමාන හංසක
කසුනි වරංගි මෙරින්නගෙ
යශාරු පංකජ පෙරේරා
නිරූපදි තිශාබ්‍ය පෙරේරා
ගෙහාන් මලිත් ජයශේඛර

## අතුරු මිතුරු
( අපට ඇරුණ පැණි බැද්දක් )

අතුරු මිතුරු සෙට්ටියා
අපේ මිතුරු කට්ටියා
කල්ලි කෙළිමු කල්ලියා
ජල්ලි ජකිරි ජල්ලියා

වැව් පිටියම අපෙයි අපෙයි
තහංචි නෑ අගෙයි අගෙයි !
ජල්ලි ජකිරි ජල්ලියා
කල්ලි කෙළිමු කල්ලියා

කොච්චියෙන් වරෙන්නේ - ගු කිය කිය වරෙන්නේ (ගු)
සුනංගු ඇයි බොලන්නේ - පමා නොවී වරෙන්නේ
කෝම් පිට්ටු ඉදියෝ - රෑට කන්න ඉදියෝ
කැට පොලෙන් බිම දන්න රස පළතුරු ඉදියෝ

පන්දු අරන් දුවන්නේ - ඔට්ටු කියා දුවන්නේ (ඔට්ටුයි)
සෝලි වැටෙයි බොලන්නේ - පරිස්සමෙන් දුවන්නේ
කොප්පර කොප්පර පිපිසද්සඳ - සීනා කැකිරි පළසද්සඳ
අපට ඇරුණු වැව් පිටියේ - පැණි බැද්දක් මවසද්සඳ

තනුව හා සංගීතය : තරුපති මුණසිංහ
ගායනය : හසිනි ඉළංගරත්න (මෙල්බර්න්)
සරිනි දිසානායක (මෙල්බර්න්) සහ
තිසල් වංසජ පාදුක්කවිතාන (සිඩ්නි)
සමඟ මෙල්බර්න් නුවර
පියත් දිසානායක ජනනි මුණසිංහ
දිමිති කස්තුරිරත්න කසුන් මුණසිංහ
නෙත්මි කුලතුංග කාවින්ද මුණසිංහ
හිමේෂ කුලතුංග

රුක්මල් නිරෝෂාන් අධ්‍යක්ෂණය කළ හා ශිරෝමා ප්‍රනාන්දු නිෂ්පාදනය කළ " ඉතින් නිවුණා ද ළය ගිනි ? " මෙල්බර්න් සිංහල ළමා චිත්‍රපටයෙන්.

## කණාමැදිරියනේ

( ළමා නිවාසයේ අපෙන් ..... )

කණාමැදිරියනේ - කණාමැදිරියනේ
ගැමදාමත් ඉන්න ළඟින්
ගැමදාමත් දෙන්න එළිය
කණාමැදිරියනේ - කණාමැදිරියනේ !

හිරු දහසක් - සඳු දහසක්
ආවා ගියා , ගියා ම යි
ළඟ හිටියේ නෑ
අපේ තනි මැකුණේ නෑ
ළමා අපේ හිත් පාළුයි - කණාමැදිරියනේ !

හිරු මඬලක් - සඳු මඬලක්
නාවේ අපේ ලොවට ඇයි ?
තේරෙන්නේ නෑ
අපේ දුක් නිමවෙන් නෑ
ළමා නිවාසය අඳුරැයි - කණාමැදිරියනේ !

තනුව හා සංගීතය : වික්ටර් රත්නායක
ගායනය : හන්සිකා සඳලි ඩයස් (කොළඹ)

## කුන්ද හට්ටි

( සිංහල අවුරුදු )

කුන්ද හට්ටි ටික ළඟට අරන්
කොන්ද නවාගෙන මන්ද බොලන් ?
කුන්ද කුදං කුදු නැන්දෙ ඉතින්
කොන්ද තවන්නට වෙයිද බොලන් ?

සිංහල අවුරුදු ළඟ එනවා - නැන්දම්මේ !

කුල්ලක් හුළගේ හාල් පොළන්නා
වංගෙඩියක් ළඟ මෝල් නටන්නා
කුරහන් ගල වට පිටි ඇඹරෙන්නා
ලිග්ගල් ගොම මැටියෙන් හැඩවෙන්නා

කැවිලි හදන්නට අපි දන්නැතුවා - නැන්දම්මේ !

පුංචි කොකිස් මල් තෙලේ පිපෙන්නා
කොණ්ඩ කැවුම් පොඩි ඔමරි කරන්නා
බලන් ඉන්න බැරි අය නළියන්නා
හැන්ද උළුක් කර නැන්ද රවන්නා

කැවිලි ගණින්නට නැගම් එන්නම් - අවුරුද්දේ !

තනුව හා සංගීතය : ප්‍රදීප් මුතුකුඩආරච්චි
(ලයනල් රන්වල ජන ගී කණ්ඩායම)
ළමා ජන ක්‍රීඩා ආශ්‍රිත ගායනා ඇසුරින් නිර්මාණය වූ
තනුවට අනුව කළ පද රචනාවකි.

ගායනය : ලයනල් රන්වල ජන ගී කණ්ඩායමේ ළමා පිරිස
අංජලී ප්‍රියංවද - චානුක බුත්සර
කාවින්දි නවෝද - සචින්ත වෙත්තසිංහ
සුපුනි සෞමතා - තිළිණ විරාජ්
විනූරි පුලාරා - මිනුර වයනක
තේනුක සත්‍යජිත්

## නෙරිය තියන්නේ

( යමු ද දහම් පාසල් ? )

දුව: නෙරිය තියන්නේ ළමා සාරියේ
කොහොම ද අම්මේ කියන්නකෝ ?
යන්න දහම් පාසල්
පමා වේවි අදනම් !

මව: නෙරිය තියන්නේ මගේ ඔසරියේ
කොහොම ද කියලා බලන්නකෝ
යන්න දහම් පාසල්
දුවේ මමත් එන්නම් !

දුව: ඇයි අද අම්මා පන්සල් එන්නේ ?
ළමයි පිරිලා විහාර ගේ ඇතුළේ
වඳින්න බෑ අදනම් !

මව: වැන්ද වාගෙයි පින් අත් වෙනවා
දූල පුතාලට
දන්නා තරමින් දහම් කියාදෙන්නම් !

දුව: අම්මා දන්නා සින්දුත් කියමු
විවේකයේදී - ළමයි ආස වේවි
අත්පොළසන් දේවි !

මව: වෙසක් ළඟයිනේ බැති ගී ගයමු
දූල පුතාලට
සරම් මසන්නම් - නෙරිය තියා දෙන්නම් !

තනුව හා සංගීතය : රෝහණ වීරසිංහ
ගායනය : විශාරද නන්ද මාලනී සමග
සරිනි දිසානායක (මෙල්බර්න්)

## ඉඳල් රටා

( ඉස්කෝලේ වග )

ඉඳල් රටා මිදුල් පුරා
ඇඳෙනා මේ පින්නේ
නිමල් සිනා කමල් නගා
කොහෙදෝ මේ යන්නේ ?
වතුසුදු මල් වැන්නේ - අපි
ඉස්කෝලෙයි යන්නේ !

උදේ රැයින් ගමෙන් ගිහින්
ගොම්මන් වී එන්නේ
පුංචි සිතෙන් ලොකු පාඩම්
කොහොම දරාගන්නේ !
ඇදුරන් නැගෑ දන්නේ - අපේ
දෙගුරුන් නැගෑ දන්නේ !

ඉරෙන් හඳෙන් වහන් වෙමින්
කෙළිලොල් විය යන්නේ
පොතින් පතින් නැණ නුවණින්
තරගය ජයගන්නේ
ඇදුරන් සැනහෙන්නේ - අපේ
දෙගුරුන් සැනහෙන්නේ !

තනුව හා සංගීතය : නිර්මල හේරත් (මහනුවර)
ගායනය : මනීෂ විජේකෝන් (මහනුවර)

## පුංචි සන්දියේ
( සමානාත්මතාවය ? )

පුංචි සන්දියේ
පුංචි ළමුන්නේ
පුංචි සිනා හඬ රැව්දෙන්නේ
පුංචි මණ්ඩියේ
රංචු ගැහෙන්නේ
රණ්ඩු කරන් නෑ අප්පච්චී

බක්කි කරත්තේ මං යනවා
අකුරු කරන්නට ඉස්කෝලේ
ගෙජ්ජි හඬද්දී ඉඩදෙනවා
පුංචි යාළුවන් මඟ දෑලේ

මාත් ගෙට ඉඳන්ම පයින් යන්නම් - මගෙ අප්පච්චි

පන්ති කාමරේ මං හැමදා
ඇයි ඉන්දන්නේ ඉස්සරහින්
වාර විභාගේ පළවෙනියා
නෑ ඉන්දන්නේ අනේ ළඟින්

මාත් ගෙට ඉඳන්ම ළඟින් ඉඳගන්නම් - මගෙ අප්පච්චි

තනුව හා සංගීතය : තරුපති මුණසිංහ
ගායනය : හසිනි ඉළංගරත්න (මෙල්බර්න්)

## අවුරුද්දක්
( නව අවුරුදු )

අවුරුද්දක්
අළුත් අවුරුද්දක් - මෙන්න ඇවිල්ලා
අවුරුද්දක්
තවත් අවුරුද්දක් - ගෙවිල ගිහිල්ලා

පෝය - පෝය ගැනපු රටේ
උන්න අපේ මුතුමිත්තෝ
දුන්න අපේ හොඳ දේවල් අපිත් ගෙනාවා
මාස - මාස ගණින රටට අපිත් ගෙනාවා !

මෙහේ හොඳත් අරන් හිතට
ලොවට වැඩක් වෙන්න හොඳට
ඉගෙන ගන්නවා - අපි ඉගෙන ගන්නවා !

පෝය - පෝය ගැන්න වුණත්
මාස - මාස ගැන්න වුණත්
දවස්වලින් අවුරුද්දේ වයස පිරෙනවා
හැම දවස ම හොඳ දවසක් වෙන්න පතනවා !

ලබන අළුත් අවුරුද්ද ම
කිරි පැණියෙන් ඉතිරෙන්නට
පැතුම් පතනවා - අපි පැතුම් පතනවා !

තනුව හා සංගීතය : වාසනා වීරකෝන් (මෙල්බර්න්)
ගායනය : මෙල්බර්න් නුවර සංබපද්ම කලායතනයේ
තිළිණි රණසිංහ නුවන් රණසිංහ
දිමිති කස්තුරිරත්න අකිල කස්තුරිරත්න
මනීෂා ගමගේ තිලාන් ගමගේ
සමඟ
මනීෂ විජේකෝන් (මහනුවර / මෙල්බර්න් )

## උණුසුම් තුරුලේ
( පිය - පුතු සුවඳ )

උණුසුම් තුරුලේ
මේ හුරු සුවඳයි ගැවසෙන්නේ
ගේ පුරා ම අප්පච්චී...

සුරතල් නළලේ
ලේ හුරු සුවඳයි මේ එන්නේ
සැමදා ම මා පුතුනේ....

තුරුලේ හංගාගෙන මා
නිකට තියා මගෙ හිස මුදුනේ
මොනව ද හිමිහිට මුමුණන්නේ - මගෙ අප්පච්චී ?

අවහිරකම් මැද මේ යන ගමනින්
ජය ම ලබාදෙන සෙත්කවියයි ගැයුවේ පුතුනේ

තරඟය දිනලා එන ද
තෑගි දිනාගෙන ඉස්කෝලේ
මොනව ද සතුටින් මට දෙන්නේ - මගෙ අප්පච්චී ?

දුන් දයාදෙයි මගෙ ලේ උරුමේ
ලොවම දිනා දෙන රන් වරමයි - ඒ මා පුතුනේ

තනුව හා සංගීතය : වික්ටර් රත්නායක
ගායනය : වික්ටර් රත්නායක සමඟ
තිසල් වංසජ පාදුක්කවිතාන (සිඩ්නි)

## කරපිංචා කුරුපිංචී
( සමාජ අසාධාරණය )

කරපිංචා කුරුපිංචී
බත් පිඟානෙ කොනක ඉඳන්
සුසුම් හෙළන්නී
කඳුළු සළන්නී....

ව්‍යංජනේ රසකරන්න
ගුණ සාරය පුදලා
ඇතිළිය ඇතුළේ
වින්ද වූ දුක් කරදර දැන් අමතක කරලා !

සලාදයේ හැඩ බලන්න
කවුරුත් වඟ වැටිලා
බත් පත මුදුනේ
රන්දවී හැඩ වැඩ කර රස ගුණ ගැන නොබලා !

තනුව හා සංගීතය : රෝහණ වීරසිංහ
ගායනය : සරිනි දිසානායක (මෙල්බර්න්)

## දේදුන්නක පාට
( සමගිය )

දේදුන්නක පාට වෙනම
වෙන් කළා ම මොනව ද වෙන්නේ ?
පන් පැදුරක පන් කොල ටික
වෙන් කළා ම මොනව ද වෙන්නේ ?

පාට - පාට එකට ඇඳී - අඳුරු අහසෙ හැඩ මවන්න
ජාති - ජාති එකමුතු වී - දිනුව දෙරණ හැඩ කරන්න
ඇයි නො සිතන්නේ ?

රෑන - රෑන එකට මෙළී - රටා පැදුර වියාගන්න
දෑත - දෑත එකට බැඳී - සමගි බලය රජ කරන්න
ඇයි පැකිළෙන්නේ ?

තනුව හා සංගීතය : විශාරද ආනන්ද රාජපක්ෂ (අවිස්සාවේල්ල)
ගායනය : නතාෂා පෙරේරා
සචිනි කොතලාවල
ශයාෂා සමරනායක
ජනනි අමා

ශ්‍රී ලංකාවේ "ලක්හඬ" ගුවන්විදුලියේ ළමා වැඩසටහනක් වෙනුවෙන් නිර්මාණය වූ ගීයකි.

විශේෂ ස්තුතිය : "ලක්හඬ" ගුවන්විදුලියේ
අධ්‍යක්ෂ - අශෝක කරුණානායක මහතා
වැඩසටහන් නිෂ්පාදිකා - ඉන්දුමතී කොඩිතුවක්කු මිය

## තැන තැන දියවර රැන්දූ
(පරිසරය)

තැන තැන දියවර රැන්දූ
නෙක නෙක මහ වැව් බැන්දූ
දාසෙන් , මහසෙන් නිරිඳුන්
දූන් ඔවදන් මසුරම් !

කස්සප හට ධනය පැතූ
සිය ධනය ම මෙය වේ යැයි
කලා වැවේ දිය පෙන් වූ
දාසෙන් නිරිඳාණෝ

"අහසින් වට එක බිඳුවක්
සයුර වෙතට යා නොදෙනු ! " යි
වැසියන් හට ඔවදන් දුන්
මහසෙන් නිරිඳාණෝ

තැන තැන තුරු වැල් සින්දූ
සැම තැන නියගය කැන්දූ
හෙළයිනි ඒ විරුවන් දුන්
රන් ඔවදන් සළකන් !

තනුව හා සංගීතය : නිර්මල හේරත් (මහනුවර)
ගායනය : මනීෂ විජේකෝන් (මහනුවර)

## කමසෙයියාවක්
( දඟකාරකම් )

පිරිමි : කමසෙයියාවක් නැද්ද බොලන්නේ ?
කයිගොන්නේ
මෙහේ වරෝ !

ගැහැණු : ඕගිරි සද්දේ පැට්ටෝ කුරුට්ටන්නේ - ගම්මැද්දේ
කොකම් පාන්නා - කොක්කට්ටන් මැද්දේ - වෙහෙක්කමේ

සියලු දෙන : එන වලියට හෝයියා
යන වලියට හෝයියා
හෝ - හෝ - හෝ හෝයියා
අපි දිනුවා - හෝයියා

ගැහැණු : විසමොදයන් , ඔතැනියන් මැරෑට්යන් - එකගොල්ලක !

ගැහැණු : ඕරම් පා ආවාම
පිරිමි : උහුලන්නේ නෑ කිඩහැල්ලන්
ගැහැණු : හෙයියන් පා කෝමද
පිරිමි : කවුරුද දින්නේ හදිහටතින් ?

ගැහැණු : මූන්දෑලා , දඟකරලා , ගුටිකාලා - යස වැඩේ !

පිරිමි : පාරම් බා බැන්නාම
ගැහැණු : ආණ්ඩුමට්ටුයි කොයිකවුරුත්
පිරිමි : හැම්ට් බා රිදුණාම
ගැහැණු : හික්කා ගෑවෙයි කොයිකාටත්

පිරිමි : කොයි වේලෙත් , කොයි කවුරුත් , දඟ නොකළොත්
වැඩිහිටියා : යස අගෙයි !

තනුව හා සංගීතය : පසිඳු චාමර (ලයනල් රන්වල ජන ගී කණ්ඩායම)
අඩහැර , කුවේණි අස්න ජන ගී නාද රටා ඇසුරින් කළ තනුවට අනුව කළ රචනාවකි.

ගායනය : ලයනල් රන්වල ජන ගී කණ්ඩායමේ ළමා පිරිස
අංජලී ප්‍රියංවද | චානුක බුත්සර
කාවින්දි නවෝද්‍යා | සචින්ත වෙත්තසිංහ
සුපුනි සෞම්‍යා | තිළිණ විරාජ්
විනූරි පුලාරා | මිනුර වයනක
තේනුක සත්‍යජිත්

දිගාමඩුල්ලේ ගැමි බස් වහර හා කෙළි ගී ඇසුරින් ලියැවුණ පර්යේෂණාත්මක පද රචනාවකි.

කමසෙයියාවක් - ඉවරයක් , අවසානයක්
කයිගොන්න - කතා බහට එක් වූ පිරිස
ඕගිරි - ඝෝෂා
පැට්ටෝ - පිරිමි ළමයි
කුරුට්ටෝ - පිරිමි ළමයි
කොකම් පානවා - සෙල්ලම් කරනවා
කොක්කට්ටන් - විහිළු තහළු
වෙහෙක්කම - සැම තැනම
විසමොදයින් - දඩබ්බරයින්
ඔතැනි - බයාදු , දුර්වල
මැරෑට්යන් - මුරණ්ඩු අය
ගොල්ල - එකට එක්වුණ පිරිස
ඕරම් පානවා - රණ්ඩුවට පැනගෙන එනවා
උහුලන්නේ - ඉවසන්නේ
කිඩහැල්ලන් - ගැහැණු ළමයි
හෙයියන් පානවා - කරදර කරනවා
හදිහටන් - රණ්ඩු කරනවා
පාරම් බානවා - වචනයෙන් බියවද්දනවා
ආණ්ඩු මට්ටු කරනවා - දඬුවම් කරනවා , පාලනය කරනවා
හැම්ට් බානවා - කෝටුවෙන් තලනවා
හික්කා ගානවා - ඉකිබිඳිනවා

ආශ්‍රිත ග්‍රන්ථය : දිගාමඩුලු බස්වහර (114-115 පිටු)
පියසේන කහඳගමගේ
ප්‍රකාශකයෝ : එස්.ගොඩගේ සහ සහෝදරයෝ

කෙළි ගී
අංකෙළිය : එන වලියට හෝයියා
යන වලියට හෝයියා
බුහු කෙළිය : හෝ-හෝ-හෝ හෝයියා
අපි දිනුවා හෝයියා

ආශ්‍රිත ග්‍රන්ථය : ශ්‍රී ලංකාවේ ජන ක්‍රීඩා (38,51 පිටු)
පී.එම්.සේනාරත්න

මෙන්න බොලේ
( පාඩමක් ! )

පුංචා :   අයියෝ අම්මේ !

වැඩිහිටියා : මෙන්න බොලේ බෙරකොටයක් වාගේ
කකුල ඉදිමිලා පුංචාගේ !
මිතුරෝ : කඩියෙක් කාලා - ඒ විස හන්ද
කකුල ඉදිමිලා පුංචාගේ

පුංචා :   අයියෝ අම්මේ !

මිතුරෝ : සට සට ගාලා කඳුළු හැලෙනවා
කකුල රිදෙනවා පුංචාගේ
වැඩිහිටියා : කඩිගුල දැකලා කෝටු ගැටුවෙ ඇයි ?
උන්ටත් රිදුණා ඔයවාගේ

පුංචා :   අයියෝ අම්මේ !

මිතුරෝ : තරගට හිතලා කරපු දෙයක්යැ ?
නපුරුකමක් නෑ පුංචාගේ
වැඩිහිටියා : මතුවට හැමදා මතක හිටින්ටයි
පාඩම් දුන්නේ ඔයවාගේ

තනුව හා සංගීතය : විශාරද රෝහණ ධර්මකීර්ති
ගායනය : විශාරද රෝහණ ධර්මකීර්ති සමග
එච්.එම්. දීප්තිකා අශානි
පී.එල්. නදීෂා පියුමි
පී.එල්. නිමාන හංසක
කසුනි වරංගි මෙරින්නගේ
යශාරු පංකජ පෙරේරා
නිරූපදි තිෂාබ්‍යා පෙරේරා
ගෙහාන් මලිත් ජයශේඛර

ටිකිරි නංගියේ
( ඉගෙන ගන්න - හිනාවෙන්න )

ටිකිරි නංගියේ - ටිකිරි නංගියේ
කළු ලෑල්ල එළිය වෙන්නෙ
හුණු කෑල්ල නිසා නේ ද ?
කළු ලෑල්ල වගෙයි මූණ
හුණු කෑල්ල හිනා අදිනවා..... !

කළු කළු රැළි - කළු කෙහෙරැළි
තළෙළු නුඹට පෙණුම ගෙනෙනවා
කළු මැදෙනා කළු ලෑල්ල
වගේ නුඹත් හැඩ වැඩ වෙනවා
ඒ වුණාට කල එළියක් නෑ..... !

සුදු සුදු රැළි - ගවුමේ රැළි
ඉස්කෝලෙට පාර කියනවා
දුකින් පෙඟුණ හුණු කෑල්ල
වගේ නුඹත් අකුරු ලියනවා
ඒ වුණාට හෙට හිනැහේවී..... !

තනුව හා සංගීතය : කලා ශූරී ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න
අග්‍රා ප්‍රේමරත්න

ගායනය : සරිනි දිසානායක

පිනිමුවන් අදින
( පුංචි නත්තල් )


පිනි මුවන් අදින
හිම කරත්තයේ නැග
ආවා-ආවා-ආවා
නත්තල් සීයා ආවා !

පොඩි ළමුන් සොයා
යස තෑගි පුරෝගෙන
ආවා-ආවා-ආවා
නත්තල් සීයා ආවා !

සීත හිමේ සුදු රැවුළ මැදින්
ලොකු හිනා හඬක් ආවා
නත්තල් අරගෙන - සතුට බෙදාගෙන
නත්තල් සිරි ආවා

රෝස මලේ රතු පාට කබායෙන්
සීනු හඬක් ආවා
කිතුනු දහම් හඬ සිහිපත් කරගෙන
නත්තල් සිරි ආවා

තනුව හා සංගීතය : සමන් රණබාහු (මෙල්බර්න්)
ගායනය : ශ්‍රී ලංකාවේ
එච්.එම්. දීප්තිකා අශානි
පී.එල්. නදීෂා පියුමි
පී.එල්. නිමාන හංසක
කසුනි වරංගි මෙරින්නගේ
යශාරු පංකජ පෙරේරා
නිරූපදි තිෂාබ්‍යා පෙරේරා
ගෙහාන් මලිත් ජයශේඛර
මෙල්බර්න් හි "ශ්‍රී ලංකා මෝර්නිං ෂෝ"
(SRI LANKA MORNING SHOW)
හි ළමා වැඩ සටහන සඳහා රචිතයි.



අකරගනේ
(ළමාවරුන්ගේ ලෝකය)

වැඩිහිටි කාන්තාව : අකරගනේ අසංචියක් වෙලා වාගෙ බොලන්නේ
අරමක්ක ද අකම්පාල වෙලා ඉන්නෙ ළමයිනේ ?
ලවක් දෙවක් නැතුව පැනපු "උඩං ජඹුරු" මක් වුණේ ?
තාන්තුවා වෙලා ඉන්නෙ මොකෝ හිච්චි හිංචනේ ?

ළමයි : අටන්පගුරු අරතපාලි කාටෙයි මේ කියන්නේ ?
අට්ටන්දර පට්ටන්දර අපට මොටෝ දෙයියනේ ?
පලන්කාදු පාරට්ටුව පලිච්චි කර හරින්නේ !

වැඩිහිටි කාන්තාව : අකරගනේ......

වැඩිහිටි පිරිස : පින්සාර දරුවන් , සුර දරුවන් ,
හොඳ දරුවන් , අප දරුවන්
සිත් ශෝක දෙවමින් , කෝප වඩමින්
විෂ පොවමින් , තලා නොදමන් !

වැඩිහිටි කාන්තාව : ළමාවරුන්ගේ ලෝකෙට
කරපොවන්න - හරි සොඳුරුයි
ළමාවරුන්ගේ ලෝකෙන්
හිතටගන්න දේ බොමයි

ළමයි : විලම්බිත අබිනියාස නොවේ ය මේ දෙඩන්නේ
ඔලොක්කමට ගන්නෙ නැතිව අපේ ගැනත් හිතන්නේ

තනුව හා සංගීතය : ජනක හේමන්ත හෙට්ටිආරච්චි
(ලයනල් රන්වල ජනගී කණ්ඩායම)
වැද්දන් කැඳවීමේ කංකාරිය , තුන්
සරණේ කවි , ජනගී රටා ඇසුරින් කළ
තනුවට අනුව කළ පද රචනාවකි.

ගායනය : නිරෝෂා විරාජිනී සමග
සචින්ත වෙත්තසිංහ සුපුනි සෞම්‍යා
චානුක බුත්සර විනූරි පුලාරා
රශ්මි බුත්සර

කලින් නිර්මාණය කළ තනුවට අනුව දකුණු පළාතේ
බස් වහර ඇසුරින් කළ පර්යේෂණාත්මක පද රචනාවකි.

අකරගනේ - අපරාදේ
අසංචියක් - වෙනසක්
මක්ක ද / මොකෝ / මක් - මොකද ?
අකම්පාල වෙලා - කම්පා වෙලා
ලවක් දෙවක් - කෙළවරක්
"උඩං ජඹුරු" - සෙල්ලමට උඩ පැනීම
තාන්තුවා වෙලා - දුක් වෙලා
හිච්චි - කුඩා
හිංචනේ - කුඩා ළමයිනේ
අටන්පගුරු - තේරුම්ගත නොහැකි දේ
අරතපාලි - ඇණුම් පද
කාටෙයි ? - කාටද ?
අට්ටන්දර - පට්ටන්දර - යුගල පදයකි
පට්ටන්දර - කයිවාරු , පණ්ඩිතකම්
මොටෝ ? - මොකටද ?
පලන්කාදු - මහන්තත්තකම්
පාරට්ටුව - වර්ණනාව
පලිච්චි කර - හෑල්ලු කර , පහත් කර
අබිනියාස - විකාර
විලම්බිත - පලකට නැති දේ
දෙඩන්නේ - කියවන්නේ , කතාකරන්නේ
ඔලොක්කමට - විහිළුවට

ආශ්‍රිත ග්‍රන්ථය : දකුණු පළාතේ කතා බහ
(වාක් කෝෂය 30 - 132 දක්වා පිටු)
පියසේන කහඳගමගේ
ප්‍රකාශකයෝ : එස්.ගොඩගේ සහ සහෝදරයෝ

පායලා
( පුංචි අපට සොඳුරු ලොවක් )


වැස්ස පායලා - අව්ව පායලා
පාට පාට - දේදුන්නක් පායලා
සතුටු සිතින් ලොවම විඩා නිවනවා
අපේ සිතට නැවුම් සුවඳ ගෙනෙනවා

ඉරක් පායලා - සඳක් පායලා
පුංචි පුංචි තරු ගොන්නක් පායලා
අහස පුරා සැණකෙළියක් මවනවා
දවස පුරා සිතේ සතුට රැඳෙනවා

ඉරක් පායලා - අව්ව පායලා
පාට පාට - දේදුන්නක් පායලා
ඉරයි සඳයි ලොවට එළිය ගෙනෙනවා
තරුගොන්නෙන් එකමුතු බව කියනවා
වැස්ස පායලා ----
පාය පායලා - පාය පායලා
පුංචි අපට සොඳුරු ලොවක් පායලා

සිංහල බස් වහරේ "පායලා" වචනය යෙදෙන අවස්ථා
කීපයක් යොදාගෙන කළ පර්යේෂණාත්මක පද රචනාවකි.

තනුව හා සංගීතය : සුරේෂ් මාලියද්දේ
ගායනය : තිසල් වංසජ පාදුක්කවිතාන ( සිඩ්නි )



## අම්මී රෝරේ
(ආදිවාසී යාදින්නක්)

අම්මී රෝරේ රෙයියා
අප්පී රෝරේ රෙයියා
නැළවුම් පොජ්ජෙන් පටැරිලා
අම්මිල අප්පිල ඇත්තෝ
මොක්කිට වන්නියලැත්තෝ
යාදිනි පොජ්ජක මන්දෙ වෙලා ?

විජේ හුරාගෙ විත්නැහියෙන්
කුවේණිලැත්තෝ මියැදුණෙන්
ජීවහත්ත දිසාලා
වැදූ පුලින්ද
වරිගේ රැකුණේ වන්නියෙ බින්තැන්නෙන්
මොරියන් කැව්වෙන් - ආසිරියෙන් !

මේ ලෝ ආදී වාසීන්නේ
දඩමං ගම් බිම් වැනසෙන්නේ
මිහිමව් සැමගෙයි
අප සැම ඇයගෙයි
ආදී ඇත්තෝ කී දේ ඇයිදෝ නාසන්නේ ?
ආදී වාසීන් යාදින්නේ !

තනුව හා සංගීතය : තරුපති මුණසිංහ
ගායනය : සරිනි දිසානායක (මෙල්බර්න්)

අගෝස්තු අටවනද ට යෙදෙන ලෝක ආදී වාසී
දිනය නිමිත්තෙන් මෙල්බර්න් නුවර 3 ZZZ
ගුවන් විදුලියේ සිංහල සේවයේ ඉරිද වැඩසටහනින්
සහ සිඩ්නි නුවරින් විකාශනය වන SBS ගුවන්
විදුලියේ සිංහල සේවයෙන් ප්‍රචාරය කළ ගීයකි.

තනුවට අනුව ලංකාවේ වැදි ජනවහර හා ජන ගී
සිංහල භාෂාව හා මුසුකරමින් ලියැවුණ පර්යේෂණාත්මක
ස්වතන්ත්‍ර පද රචනාවකි.

වැදි ජන ගී - නැළවිලි ගීය

"අම්මී රෝරේ රෝ රෙයියා
අප්පී රෝරේ රෝ රෙයියා"
(වැදි නායක තිසාහාමි)

වැදි බස් වහර :
අම්මිල ඇත්තෝ - අම්මා
අප්පිල ඇත්තෝ - තාත්තා
නැළවුම් පොජ්ජ - නැළවිල්ල
පටැරිලා - මග හැරිලා
මොක්කිට ? - මොකටද ?
වන්නියලැත්තෝ - වැදි ජනතාව
යාදිනි පොජ්ජ - යාදින්නාව
මන්දෙ වෙලා - (යාදින්නාවෙ) යෙදිලා
විජේ හුරා - විජය කුමාරයා
කුවේණිලැත්තෝ - කුවේණිය
ජීවහත්ත , දිසාලා - විජය රජුට හා කුවේණියට දාව
උපන් දරුවා හා දැරිය
පුලින්ද වරිගය - ජීවහත්ත , දිසාලා යුවලගෙන් බිහිවුණ
පුලින්ද පරම්පරාව (වැදි පරපුර)
වන්නිය , බින්තැන්න - වැදි ජනයාගේ වාස භූමි
මොරියන්කැව්ව - ඊ තලය
ආසිරිය - පොරව

ආශ්‍රිත ග්‍රන්ථය : ශ්‍රී ලංකාවේ ආදිවාසීන් 240,216-219,273-285 පිටු
සංස්කරණය : මහාචාර්ය දයානන්ද සෝමසුන්දර
ආදිවාසී ජන අධ්‍යන කේන්ද්‍රය
ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලය
ප්‍රකාශකයෝ : එස්.ගොඩගේ සහ සහෝදරයෝ

## 2062
( මව්බිමෙන් ඇරයුමක් ! )

අනාගත
දරුවා : ක්ෂීරපථෙන් කිරි-දියර දෙවන්නම්
ගගන තලෙන් තරු පොකුරු නෙළන්නම්
චක්‍රවාට බිඳ නිදන් ගෙනෙන්නම්
මාතෘ භූමි සරු කරවනවානම්
වර්තමාන
වැඩිහිටියා : අව්ව අරන් එන්න එන්න
වැස්ස අරන් එන්න එන්න
හුළඟ අරන් එන්න එන්න
නිල්ල අරන් එන්න !
වර්තමාන
දරුවන් : සූර්ය කිරණේ නැති - චන්ද්‍ර මඩලේ නැති
(ඕං රිං කට්ටු කට්ටු)
චිත්ත ප්‍රීති ගේන . ස්නේහෙ පාන
(ඕං රිං කට්ටු කට්ටු)
මන්ත්‍රයයි මුවේ
මිනිස්කම් ලොවේ
අනාගත
දරුවා : ශක්‍රවර්ෂ මැඩ ආපසු එන්නම්
පැටව් තලේ නිල සොයමින් එන්නම්
වර්තමානයට හෙට ගෙන එන්නම්
මාතෘ භූමියට සෙත සැළසේනම්
වර්තමාන
වැඩිහිටියා : කිරණ දිගේ එන්න එන්න
වළා දිගේ එන්න එන්න
පවන දිගේ එන්න එන්න
තරු අතරින් එන්න !

වර්තමාන
දරුවන් : රක්ත තාප නැත - ශ්වේත ශීත නැත
(ඕං රිං කට්ටු කට්ටු)
රම්‍ය ක්ෂේම භූමි . පුණ්‍ය භූමි
(ඕං රිං කට්ටු කට්ටු)
මාතෘ භූමියේ
ලංකා භූමියේ
වර්තමාන
වැඩිහිටියා : උපන් බිමට එන්න එන්න
ඉන්න තැනින් එන්න එන්න
දැණුම නුවණ දෙන්න දෙන්න
රටට දැන දෙන්න !

තනුව හා සංගීතය : සහන් රන්වල
නෙළුම් ගී, ශාන්ති කර්ම ගී, ජන ගී නාද මාලා
ඇසුරින් කළ තනුවට අනුව කළ රචනාවකි.

ගායනය : සහන් රන්වල සමග
ලයනල් රන්වල ජන ගී කණ්ඩායමේ
සචින්ත චෙත්තසිංහ සුපුනි සෞම්‍යා
චානුක බුත්සර විනුරි පුලාරා
රශ්මි බුත්සර

# අතුරු මිතුරු

**විශේෂ ස්තූතිය**

* ඩෙන්සිල් ජයවීර මහත්මා
* ගීත ගායනය සඳහා දායකත්වය දුන් සියලුම ශිල්පී, ශිල්පිනියන්
* ගීත ඇතුලත්කර ගැනීම සඳහා අවසරය ලබාදුන් සියලුම සංගීතවේදීන් හා දෙමාපියන්
* සහන් රන්වල කලාකරුවාණන්
* රෝහණ ධර්මකීර්ති, තරුපති මුණසිංහ සංගීතවේදීන්
* මව්බිමේ "ලක්හඬ" ගුවන්විදුලියේ අධ්‍යක්ෂ අසෝක කරුණානායක මහත්මා
* මෙල්බර්න් නුවර චැනල් 31 හි "ශ්‍රී ලංකා මෝර්නිං ෂෝ" රූපවාහිනී වැඩසටහනේ අධ්‍යක්ෂ නිමල් අල්විස් මහත්මා සහ ළමා වැඩසටහන ඉදිරිපත් කළ විනීතා විජේරත්න මහත්මිය
* "ඉතින් නිවුණාද ළය ගිනි ?" මෙල්බර්න් ළමා චිත්‍රපටයේ නිෂ්පාදිකා ශිරෝමා ප්‍රනාන්දු මහත්මිය
* නුගේගොඩ කේ. එන්. ඩී ආයතනයේ නිහාල් ප්‍රනාන්දු මහත්මා
* විමල් ජේ. ශ්‍රියාරත්න මහත්මා

---

චිත්‍රය : සිසිර දිසානායක

---

චිත්‍රය සහ පොත් පිංච පරිගණකකරණය :
සුමිත් සහ දේවිකා පෙරේරා (අවිස්සාවේල්ල / මෙල්බර්න්)

---

කවර නිර්මාණය : සිසිර විජේතුංග